# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

එස්.ඒ.එස්.එස්. පෙරේරා
අංක 66 දෙවන පටුමග
වේරගල
පාදුක්ක.

<u>අභියාචක</u>

**අභියාචනා අංකය :**
**RTIC Appeal No. 540/2021**

එදිරිව

සීතාවක ප්‍රදේශීය සභාව
හංවැල්ල.

<u>පොදු අධිකාරිය</u>

| | | | |
|---|---|---|---|
| **ඉදිරිපිටදී** | : | 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) | - සභාපති |
| | | 2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) | - කොමසාරිස් |
| | | 3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන | - කොමසාරිස් |
| | | 4. නීතිඥ ජගත් ලියන ආරච්චි | - කොමසාරිස් |

**පෙනී සිටීම** : අභියාචක නැත
පොදු අධිකාරිය නැත

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - 2022.07.12
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නොමැත.

**විභාග කළ දිනය** : 2022.07.18, 2022.09.08

**තීරණය කළ දිනය** : 2022.09.08

**<u>කොමිෂන් සභාවේ තීරණය :</u>**

**අභියාචනයට පසුබිම්වූ කරුණු**

අභියාචක විසින් 2020.09.10 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

> *“2020. 08.24 වෙනි දින සීතාවක ප්‍රාදේශීය සභාවේ ගරු නියෝජ්‍ය සභාපති තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති කමිටු රැස්වීමේදී, වෙරගල දෙවෙනි පටුමග සහ සම්බන්ධ වී ඇති උප මාර්ගයේ ගැටලුව සම්බන්ධයෙන් ගන්නා ලද තීන්දු සම්බන්ධයෙන් වන තොරතුරු.”*

ඒ අනුව, තොරතුරු නිළධාරි පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2020.10.10 දිනැතිව නම්කළ නිළධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිළධාරි විසින් ද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2021.02.27 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

අභියාචකගේ 2020.09.10 දිනැති තොරතුරු ඉල්ලීමට සහ 2020.10.10 දිනැති අභියාචනයට ප්‍රතිචාර දැක්වීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි විධිවිධානවලට අනුකූලව, පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාල නියමයන් තුළ පුරවැසියන් විසින් ඉදිරිපත් කරනු ලබන සියලු තොරතුරු ඉල්ලීම් සහ අභියාචනා සඳහා ප්‍රතිචාර දැක්වීමට, පනතෙහි 24 (3) සහ 25 (1) වගන්ති ප්‍රකාරව පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා හටද, පනතෙහි 31(2) සහ 31(3) වගන්ති ප්‍රකාරව නම්කළ නිලධාරියා හට ද පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම පොදු අධිකාරියේ තොරතුරු නිළධාරියා සහ නම්කළ නිළධාරියා විසින් පැහැර හැර ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

අභියාචක විසින් 2022.07.12 දිනැති ලිපියක් සභාව වෙත එවමින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කර සිටී.

> *"............ 2020.08.14 දින අනුව ප්‍රාදේශීය සභාවේ කමිටු රැස්වීමේදී 16 වන අතුරු මාර්ගයේ කොටසක් විල්බර්ට් සැමර ජේඩිගේ යන අයගේ ඉඩමට නතු කර ගැනීම සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂණයක් කල යුතු බවට තීරණය කරන අවස්ථාවේදී පාර්ශව දෙකම සීතාවක ප්‍රාදේශීය සභාව විසින් කරන ලද කැඳවීම් ලිපියට අනුව පෙනී සිටිය බවද වර්ෂ 3 කට පෙර එනම් 2020 වර්ෂයේදී දේශපාලන වාසි අපේක්ෂාවෙන් පාක්ෂිකව මා නොමැති අවස්ථාවක කමිටුව පැමිණ ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඇති බවද, මා තොරතුරු පනත යටතේ ඉල්ලා සිටියේ ස්ථානීය පරීක්ෂණයෙන් පසුව ගන්නා ලද තීරණ බවත්, 2022.12.07, 2021.08.16 යන දිනයන් වලදී සීතාවක ප්‍රාදේශීය සභාව විසින් නැවත නැවතත් තොරතුරු ඉල්ලීම් කරන ලද පුරවැසියාව නොමග යැවීමට උත්සහ කරමින් සිටින බවද දන්වා සිටී."*

**සලකා බැලීම**

අභියාචක විසින් ඉදිරිපත් කරන ලද උක්ත තොරතුරු ඉල්ලීමට පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි ප්‍රතිචාර දක්වා නොමැති අතර ඉන් පසුව අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයටද පොදු අධිකාරියේ නම් කළ නිලධාරි විසින් ප්‍රතිචාර දක්වා නොමැත. මෙම තත්වය පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන බරපතල ලෙස උල්ලංඝනය කිරීමකි.

උක්ත පනතේ 24 වන වගන්තිය යටතේ තොරතුරු නිලධාරි විසින් තොරතුරු ඉල්ලීමක් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලිව දක්වා තිබියදීත් එකී විධිවිධාන පරිදි ක්‍රියා කළ බවට කරුණු අනාවරණය නොවේ. එසේම, පනතේ 31 වන වගන්තිය යටතේ අභියාචනය ඉදිරිපත් කළ පසු නම් කළ නිලධාරි විසින් ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලිව දක්වා තිබියදීත් ඒ පිළිබඳව ක්‍රියා කළ බවට කරුණු අනාවරණය නොවේ.

මේ අන්දමින් තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම් කිසිසේත් සැහැල්ලුවෙන් සැළකීමට කොමිෂන් සභාවට හැකියාවක් නොමැත. එබැවින් පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි විසින් 2016 අංක 12 දරණ පනතේ විධිවිධාන යථා පරිදි ක්‍රියාවට නැංවීමට අසමත් වන්නේ නම් ඔවුනට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කොමිෂන් සභාවට සිදු වේ. එබැවින් මින් ඉදිරියට තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය වීම් වළක්වා ගැනීම සඳහා පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට කොමිෂන් සභාව තරයේ අවධාරණය කරයි.

උක්ත තොරතුරු ඉල්ලීමේ සඳහන් තොරතුරු ලබා නොදීමට අදාළ කරගත හැකි ව්‍යාතිරේකයක් පනතේ 5 (1) වගන්තියෙහි නොමැති බවට පෙනී යන බැවින් උක්ත සඳහන් තොරතුරු ඉල්ලීමේ ඇතුළත් සියලුම තොරතුරු 2022.10.06 දිනට ප්‍රථම, මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව, අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට අපි තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවටද වැඩිදුරටත් තීරණය කරමු.

මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.